# උපකාරක පංති මඟින් සිදුවන සමාජීය බලපෑම
## (කුරුණෑගල නගරය ඇසුරින්)

යූ.පී.පී.එස් සමරනායක[1]

**සංක්ෂේපය**

වර්තමානයේ දී, අධ්‍යාපනය යනු මිනිසෙකු විසින් ජීවිතයේ ලැබිය යුතු අනිවාර්ය අංගයක් වී ඇත. නමුත් අතීතය ගැන සලකා බලන විට අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් වූයේ, ආගමික සිද්ධස්ථාන ය. විශේෂයෙන් බෞද්ධ රටක් වන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ මූලාස්ථානය වූයේ, පන්සල ය. නමුත් බටහිර ජාතීන්ගේ ආගමනයක් සමඟම මෙම තත්ත්වය වෙනස් වන්නට විය. එනම් ඔවුන්ගේ ප්‍රතිසංස්කරණ වලට අනුව, ලංකාවේ මෙතෙක් වූ අධ්‍යාපන රටාව සීඝ්‍රයෙන් වෙනස් වන්නට විය. පාසල් මූලික අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දෙන්නට විය. මුල්කාලීන ව මෙම පාසල් අධ්‍යාපනය සිසුන් හට අවශ්‍ය තරමටත් වඩා ප්‍රමාණවත් විය. නමුත් වර්තමානය වන විට සිසුන් හට තරඟකාරී අධ්‍යාපන රටාවකට මුහුණ දීමට සිදුවී ඇත. ඒ තුළ ඔවුහු පාසල් අධ්‍යාපනයට පමණක් සීමා නොවී උපකාරක පංති කෙරෙහි යොමු වී තිබේ. නමුත් මෙම උපකාරක පංති සංස්කෘතිය පාසල් අධ්‍යාපන රටාව වෙනස්කර ඇත. මෙම වෙනස් වීම අධ්‍යයන ගැටලුව ලෙස යොදා ගනිමින් උපකාරක පංති මඟින් සිදුවන බලපෑම පිළිබඳ මෙම අධ්‍යයනය මඟින් විමර්ශනය කර ඇත. අධ්‍යයන සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත යොදා ගත් අතර කුරුණෑගල නගර සීමාවේ පුද්ගලයින් 100 කින්, යුත් සසම්භාවී නියැදියක් යොදාගන්නා ලදී. අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් හා ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙන් දත්ත රැස්කර ගෙන ඇත. නියැදියට අයත් වූයේ, කුරුණෑගල නගරයේ මධ්‍යම බස්නැවතුම්පොළ අසල පිහිටි වෙළෙඳසැල් හිමියන්, බස් රථ රියදුරන් හා කොන්දොස්තරවරුන්, චිත්‍රපට ශාලා හිමියන් හා ඒ අසල වෙළෙඳසැල් හිමියන්, උපකාරක පංති මෙහෙයවන ගුරුවරුන් හා එම ආයතනික හිමිකරුවන් ය. මීට අමතරව ද්විතීයික මූලාශ්‍ර වන සඟරා, පුවත්පත් හා අන්තර්ජාලය ඇසුරින් ද්විතීයික දත්ත ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදී. විශේෂයෙන් ම අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ගෙන් 92% ක් ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය ලබා ගන්නේ උපකාරක පංති වල අධාරයෙනි. සිසුන්ගෙන් 55% ක් උපකාරක පංති වෙත යොමු වී ඇත්තේ, අධ්‍යාපනය ලැබීමේ අරමුණෙන් වන අතර 37% ක් විලාසිතාවක් ලෙස හෝ නිවසින් නිදහසක් ලබා ගැනීමට හෝ වෙනත් අරමුණු මූලික කරගෙන ය. එම තත්ත්වය නිසා උපකාරක පංති සංස්කෘතිය සමාජය තුළ ගැටළු රැසක් උත්පාදනය කර ඇත. එනම් උපකාරක පංති සංස්කෘතිය විසින් සමාජය තුළ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය.
prabodhasubha@gmail.com

වූවන්, ජීවිත විනාශ කර ගත්තන්, ළමා ගණිකාවන්, විවිධ රෝගවලට භාජනය වූවන්, හා තම අධ්‍යාපනය අත්හැර දැමූවන් වැනි නොයෙකුත් විෂමාචාර ක්‍රියාවන් සඳහා සානුබලයක් සපයා ඇති බැව් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *උපකාරක පංති, අධ්‍යාපනය, සිසුන්, සමාජයීය බලපෑම*